චක්‍රලේඛ අංක : 05 /2024

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 , ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර , රාජගිරිය.
2024.03. 11

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

<u>සම්මුඛ පරීක්ෂණ අවස්ථා වලදී සුදුසුකම් තහවුරු කිරිම සඳහා ඉදිරිපත් කරනු ලබන සහතිකපත් සම්බන්ධව</u>

බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා 2011 බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අදාලව සිදු කරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් තහවුරු කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ වලට පෙනී සිටින අයදුම් කරුවන් විසින් ව්‍යාජ සහතික පත් ඉදිරිපත් කරනු ලබන බවට කොමිෂන් සභාව වෙත කරුණු වාර්තා වී ඇත.

02. අයදුම්කරුවන් විසින් යම් තනතුරක් සඳහා බඳවා ගැනීමේ පටිපාටිය ප්‍රකාරව තම සුදුසුකම් තහවුරු කිරිමට ඉදිරිපත් කරනු ලබන සහතික පත් පිලිගත් ආයතනයකින් නිකුත් කරන ලද්දක් විය යුතු අතර , පිලිගත් ආයතනය යන්න පහත පරිදි දැක්වේ.

I . රජයේ ආයතන.

II. රජයේ විශ්ව විද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත උසස් අධ්‍යාපන ආයතන.

IIi . තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි ආයතන.

Iv . පොල්ගොල්ල ජාතික සමූපකාර සංවර්ධන ආයතනය,ජාතික හෝ පළාත් සමූපකාර මණ්ඩලය.

V . රජයේ ආයතනයක ලියාපදිංචි ආයතනය.

03. සමූපකාර සේවයේ තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් බඳවා ගැනීමේදී ව්‍යාජ සහතික ඉදිරිපත් කර තනතුරු වලට පත්වීම වැලැක්වීමේ අවශ්‍යතාවය සලකා මෙම තීරණය ගෙන ඇති අතර ඉදිරි සම්මුඛ පරීක්ෂණ වලදී අයදුම්කරුවන් විසින් මෙම චක්‍රලේඛ විධිවිධාන පරිදි ඉදිරිපත් කරනු ලබන සහතික පත් සඳහා පමණක් ලකුණු ලබා දීමට කටයුතු කල යුතු වේ

04. මෙම චක්‍රලේඛ විධිවිධාන 2024.03.15 දින සිට බලපැවැත්වේ

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම්, පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප.) - කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.